රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2018

මගේ අංකය : EST 5/3/4/4 – Vol.1
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.08.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>වැටුප් පරිවර්තන නිවැරදිව සිදු කිරීම සහ විශේෂ වැටුප් වර්ධක හා විශේෂ දීමනා සඳහා නිසි අනුමතිය ලබා ගැනීම</u>

කාර්ය මණ්ඩල වැටුප් පරිවර්තන නිවැරදිව සිදු නොකිරීමත් ඇතැම් අවස්ථාවල නිසි අනුමතිය ලබා ගැනීමෙන් තොරව නිලධරයන් වෙත විශේෂ වැටුප් වර්ධක සහ දීමනා ලබා දීමත් මගින් යම් යම් ගැටලු උද්ගත වී ඇති බැවින් ඉදිරියේ දී එවැනි ගැටලු ඇති නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ඇතුළත් චක්‍රලේඛයක් අදාළ බලධරයන් වෙත නිකුත් කළ යුතු බව 2018.01.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව, එම අහිතකර තත්ත්වයන් ඉදිරියට ද ඇති වීම වැළැක්වීම සඳහා කාර්ය මණ්ඩල වැටුප් පරිවර්තනය කිරීම් හා නිලධරයන්ට විශේෂ වැටුප් වර්ධක සහ දීමනා ලබා දීම විධිමත් බලධරයන්ගේ අනුමතිය මත සිදුකරන ලෙසත් යම් ගැටලුවක් මතුවන්නේ නම් අදාළ සියලු තොරතුරු සමඟ විධිමත් බලධරයන් විමසා අවශ්‍යය පැහැදිලි කිරීම් ලබා ගන්නා ලෙසත් මෙයින් දන්වමි.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය